# සීගිරි ගී නිර්මාණයට අනුභූති වූ විවිධත්වය

## The Variety Experienced in Sigiri Graffiti

රංජිත් සේනානායක

**Abstract**

Sigiriya is an art gallery that depicts the historical prowess of Sri Lanka. Painting and graffiti on mirror wall are marked as the oldest literary record of Hela poetry. The public was delighted to see the Sigiri paintings belonging to the fifth century have expressed their views.  From the 8th century to the 11th century, the various concepts formed in the minds of the people of different fields were recorded on the mirror wall called Katapath Paura. In the Sigiriya graffti varius offects of human societies social practices and social realities are reflected. This Study intends to examine how such social realities are presented through Sigiri graffiti.

**Keywords:-** Sigiri Graffiti, Contemporary, Reflect, fields,  Concepts

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය නිරූපණය කෙරෙන සීගිරිය පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සිහිවටනයකි. ජීවමාන ලෙසින් වනිතා සිතුවමින් විසිතුරු වූ සීගිරිය සිංහල පද්‍ය සම්ප්‍රදායයේ ඉපැරණි ම සාහිත්‍ය සටහන් සහිත වූවක් බව එහි ඇති ගීවලින් සනිටුහන් වේ. පස් වෙනි සියවසට අයත් සීගිරි චිත්‍ර දැක බලා ගත් මහජනයා ප්‍රීති ප්‍රමෝදය ඇති කර ගත්හ. 8 වැනි සියවසේ සිට 11 වන සියවස දක්වා විවිධ තරාතිරම්වල ජනයා විසින් තමන්ගේ සිත් තුළ ඇති කරගත් කාව්‍ය සංකල්ප කුරුටු ගී නමින් කැටපත් පවුරෙහි සටහන් කෙරිණි. ඔවුන්ගේ අධ්‍යාත්මය තුළ ඇති වූ විවිධ හැල හැප්පීම් සංකල්පනයට ගනිමින් සටහන් කර ඇත්තේ සමාජ හා ජීවිත පරිඥානය ලබා දෙමින්

ය. ඒ අනුව මේ අධ්‍යයනයේ දී බොහෝ රචකයන් අතින් නිර්මාණය වූ සීගිරි ගීවලින් සමාජයේ විවිධ පුද්ගලයන්ගේ ප්‍රේමය, එහි අපේක්ෂා සහ ප්‍රේම විප්‍රලම්භය යන කරුණු පමණක් නො ව සමාජ යථාර්ථය, ඔස්සේ පැවතුණු ව්‍යාකූල තත්වය, සාම්ප්‍රදායික ආගමික හැඟීම් ආදී වශයෙන් සීගිරි කවීන්ගේ නිර්මාණයන්ට ලැබූ නොයෙකුත් ආභාසයන් මෙහිදී විවරණය වේ.

**යතුරු පද:-** සීගිරි ගී, සමකාලීන, නිරූපණය, ක්ෂේත්‍ර, සංකල්ප

**හැඳින්වීම**

විවිධ රසිකයන් අතින් ස්වකීය හදපත්ලෙහි ජනිත වූ හැඟීම් කැටපත් පවුරේ ගී ආකෘතියේ ලියැවිණි. එය අධ්‍යයනයේ දී රජවරුන්, පැවිද්දන්, වෘත්තිකයන්, කලාකාමීන්, සාමාන්‍ය පොදු ජනතාව ආදී වශයෙන් නොයෙකුත් තරාතිරමේ අය ඊට දායක වූහ. එම රචකයන් සමකාලීන සමාජ ජීවිත විවරණය තුන් කල්හි ම නිරූපණය වන අයුරින් රචනා කිරිම සුවිශේෂත්වයකි. ප්‍රේමය, ප්‍රේම වියෝගය ඉන් ඇති වන චිත්ත චෛතසික සංකල්ප විවරණය කෙරෙන්නේ රසිකයාට ඒ පිළිබඳ ජීවිතාවබෝධය ලබා දෙමින් ය.

**සාහිත්‍ය විමර්ශනය**

1956 සෙනරත් පරණවිතානයන් විසින් රචිත Sigiri Graffiti යන කෘතියෙහි දෙවන වෙළුමෙහි අන්තර්ගත සීගිරි ගී පිළිබඳ අධ්‍යයනයකි. සෙනරත් පරණවිතානයන් විසින් රචිත "සීගිරි ගී වියරණ" (1962 පළමු මුද්‍රණය) මගින් සීගිරි ගී පිළිබඳව ව්‍යාකරණ විභාගයක් සිදු කොට තිබෙන්නේ ගීවල සෑම පැතිකඩක් ම ආවරණය කරමින් ය. 1963 නන්දසේන මුදියන්සේ විසින් රචිත "සීගිරි ගී" (ද්විතීය භාගය) යටතේ දීර්ඝ ප්‍රස්තාවනාවකින් යුක්තව එක් එක් ගීය පිළිබඳව ගැටපද විවරණ සහිත අධ්‍යනයකි. 2000 වසරේ සුචරිත ගම්ලත් විසින් රචිත "සීගිරි කුරුටු ගී" කෘතියෙහි ගී පිළිබඳව කරන ලද තවත් විවරණයකි. 2004 "සීගිරි පද්‍යාවලිය" යටතේ දීර්ඝ ලෙස සීගිරි ගීවල අන්තර්ගත විශේෂ කරුණු අවධාරණය කරමින් ව්‍යාකරණ විභාග දක්වමින් කරනු ලැබූ තවත් අධ්‍යයනයකි. පී.බී. මීගස්කුඹුරයන් විසින් රචිත සීගිරි ගී කාව්‍ය භාෂාව (ලිපිය) සෙනෙවිරත්නගේ උපහාර ලිපි සංග්‍රහය, 2004

කොත්මලේ අමරවංශ හිමියන් අතින් සංස්කරණය කරන ලද "සිංහල සාහිත්‍ය ලතා" කෘතියෙහි ගී නැමති මාතෘකාව යටතේ නන්දසේන මුදියන්සේ විසින් සීගිරි චිත්‍ර එහි ඓතිහාසික ස්වරූපය හා සීගිරි ගීවල පවත්නා විශේෂත්වය කෙටියෙන් විග්‍රහයට බඳුන් කෙරිණි යනාදී වශයෙන් මේ අධ්‍යයනයේ දී ඉහත සඳහන් කෘති සහ ශාස්ත්‍රීය ලේඛන දත්ත රැස් කිරීමේ දී ඉමහත් පිටිවහලක් විය.

### පර්යේෂණ ගැටලුව

සීගිරි ගීවලින් විවරණය කෙරෙන සමාජ ජීවිතය කෙබඳු ද යන්න විමර්ශනය මෙහි පර්යේෂණ ගැටලුව වේ.

### පර්යේෂණ අරමුණු

සීගිරි ගී නිර්මාණයට අනුභූති වූ විවිධත්වයේ විචිත්‍රත්වය අධ්‍යයනය කිරීමේදී

I. සීගිරි ගී නිර්මාණය වූයේ කවුරුන් අතින් ද යන්න සොයා බැලීම.

II. ඇතැම් සීගිරි ගීවලින් විවරණය වන සමාජයේ තත්වය සහ පුද්ගල මනෝභාව කවරේ ද යන්න විමර්ශනය කිරීම මෙහි අරමුණු වේ.

### පර්යේෂණ ක්‍රමවේදය

මේ අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය ඇසුරට ගත් අතර විද්වතුන් විසින් රචිත අනෙකුත් පර්යේෂණ හා අධ්‍යයන ලිපි අන්තර්ජාල පහසුකම් ඇසුරෙන් දත්ත එක්රැස් කිරීම හා ශාස්ත්‍රීය සහ සංස්කරණ විවිධ විද්වත් පර්යේෂණ ලිපි පරිශීලනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය යි.

### පර්යේෂණයේ වැදගත්කම

සීගිරි ගී අධ්‍යයනයේ දී මිනිස් සිතේ පැවතුණු හැඟීම් සෞන්දර්යාත්මකව නිරූපණයට කවියා දක්වූ කෞශල්‍යය කොතරම් ද යන්න මේ අධ්‍යයනයෙන් යම්තාක් දුරට ගම්‍ය වේ.

**සාකච්ඡාව**

දැනට ඉතිරි ව ඇති ඉපැරණි ම සාහිත්‍ය සටහන වන්නේ සීගිරි ගී කාව්‍ය වේ. ක්‍රි.ව.8, 9, 10 ශතවර්ෂවලදී සීගිරි පර්වතයේ පිහිටි චිත්‍ර නැරඹීමට ගිය ඇතැම් රසිකයන් විසින් ස්වකීය හදපත්ලෙහි ජනිත වූ හැඟීම් කැටපත් පවුරෙහි කුරුටු ගී නමින් සනිටුහන් කෙරිණි. හෙළ කවි කලාවේ ප්‍රභවය සංකේතවත් කරන සීගිරි ගී රචනා වීමට වස්තු බීජ වූයේ පස්වැනි සියවසට අයත් සීගිරි චිත්‍ර ය. කාල නිර්ණය අනුව සීගිරි චිත්‍ර සිතුවම් කරන ලද්දේ පළමු කස්සප (ක්‍රි.ව.473 - 491) විසින් බව ද පොදුවේ පිළිගෙන තිබේ. සීගිරි ගී පිළිබඳව සටහනක් තබන ආනන්ද කුලසූරිය

''කැටපත් පවුරේ කුරුටු ගා ඇති ලියවිලි පෙළ එතැනට නොයෙක් කාලවලදී පැමිණි ජනී ජනයා විසින් තම සිතැගි පළ කරමින් ලියන ලද....'' (කුලසූරිය, 1962, 227 පිටුව)

ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය නිරූපණය කෙරෙන සීගිරි ගී අතර ඇතැම් නිර්මාණ උසස් රචනාවලට දෙවැනි නො වන බවත්, ශිෂ්ට මනුෂ්‍ය වර්ගයාගේ විනෝදාස්වාදය, පිළිඹිබු කෙරෙන්නක් ලෙසත් එනිසා ම ඇතැම් ප්‍රජාවගේ දෘෂ්ටි පථයට නිරන්තරයෙන් යොමු වූවක් ලෙසත් පෙන්වා දිය හැකි ය.

සීගිරියට මහජනයා එන්නට පටන් ගෙන ඇත්තේ ක්‍රි.ව.8 වන සියවසේ සිට ය. 11 වෙනි සියවස දක්වා මහජනයාගේ සම්ප්‍රාප්තිය සිදු වූ බව සීගිරි ගීවලින් අනාවරණය වේ. ඒ නිසා සීගිරි චිත්‍ර අටවැනි සියවසට වඩා පැරණි නො වන බව පැවසේ (දිසානායක, 1969, ප්‍රස්තාවනාව).

සීගිරි ගී විමර්ශනයට බඳුන් කිරීමේ දී, නම් ගොත්, ග්‍රාම නාම සඳහන් කරන ලද ගී, බොහෝ රචකයන්ගේ ගී නිර්ණාමික වීම, වෘත්තීය සඳහන් කරමින් රචිත ගී, රජවරුන් අතින් ලියන ලද ගී,පැවිද්දන් විසින් රචනා කරන ලද ගී, නියම්ජෙට්, පැයක්කැමි, ඔළ්කමණ, වෙද්නා ආදී නිලධරයන් හැරුණු කොට වෙණද, ඇදුරු, දුනුවේ, ආදී විවිධ රැකියාවල නියුතු වූවන් විසින් රචිත ගී (දිසානායක, 1969, 172 පිටුව) සමකාලීන ජීවිත තතු විවරණය කරනු ලබන ගී, ස්වාභාවික

සෞන්දර්යය නිරූපිත ගී, පුද්ගල ස්වභාවය විවරණය කරන ගී, චිත්ත චෛතසික විග්‍රහයන් දැක්වෙන ගී, දාර්ශනික කියමන්වලින් පිරීගිය ගී යනුවෙන් කරුණු සලකා බලන කල නොයෙකුත් තරාතිරම්වලට අයත් සීගිරි කවීන්, විවිධ පැතිකඩ අනාවරණය කරමින් රචිත ගී හෙළ සාහිත්‍ය සටහනක් වශයෙන් හඳුනා ගත හැකි ය.

504, 615, 627 යන ගීවල තමන්ගේ නම් ගම් ගීයෙහි ම ඇතුළත් කොට තිබීම විශේෂත්වයකි. එයින් රචකයා පිළිබඳ දැනුවත් වේ.

''මත්වග සමන ගී සගල්රෙජන ගෙ පසිල්ලන් අබුයු

අප ගැහැනි නෙ වී බැන්දි යා ගී සැහැලි තා'' (මුදියන්සේ (1963),226)

අට වැනි ශතවර්ෂයට අයත් බමර ගී විරිතෙන් රචනා කරන ලද මෙයින් කියවෙන්නේ තමා ගැහැනුන් නො වන බවත් පෙම්වතුන්ගෙන් වියෝ වීම නිසා තම සිත ඔද්දල් වී ඇති බවත් ය. මෙහි එන '**සගල් රෙජන**' යනු මේ ගීය ලියූ තැනැත්තා වේ. මෙහි සඳහන් '**බැන්දි යා ගී සැහැලි**' ගී සහ සැහැලි යනුවෙන් බඳනා ලද බව යි.

''ශ්‍රී කීර්තිවම්යෙමි ලීමි

වියෙන් සිහි වෙය් දුට කෙරෙය් අත් සොන්ද් ම සිහිල්''

(එම 306)

මෙහි දැක්වෙන 'කීර්තිවම්' නැමැත්තා තමා බවත් උක්ත ගීය තමන් අතින් ලියූ බවත් දක්වමින් ''ලීමි'' යනුවෙන් උත්තම පුරුෂ ඒක වචනයෙන් තබා තිබේ. සීගිරිය දැකීමෙන් කෙනෙකුට සතුටු විය නො හැකි නම් ඔහු අන්තැනෙක එබඳු පර්වතයක් තැනිය යුතු බව පැවසීමෙන් 9 වෙනි ශතවර්ෂයේ දී සීගිරියෙහි සෞන්දර්යය කෙතරම් ද යන්න කීර්තිවම් නැමැත්තාගෙන් අනාවරණය වේ.

සිරිසඟබෝ නම් රජ කළ උදය නම් රජුගේ පබැඳුමක් වන්නේ,

''ස්වස්ති සිරිස (ග්බො අ) බා මහරජ

උදා කී වදන් මසිව් ගෙන

ඇවි (ද් මෙ ගිය) ලී (වෙ)''

රන්වනු ගිරිබිතැ (වී ගැ) ති තමා ලී

නො රිසි ද දහ බ(ල) යත් එකින් සැක

රතු උපුලැති පැලැන්දි'' (667 ගීය) (එම 343)

සිරිසඟබෝ අබා නම් විරුදාවලි ලත් උදා නම් මහරජ කී වදන් ගෙන අවුත් මසිව් නැමැත්තා විසින් මේ ගීය ලියන ලද්දේ ය. ''පර්වත බිත්තියෙහි සිටි රන්වන් තැනැත්තිය ගැති වූයේ තම අඹුව රුචි නොවූ හෙයින් ද? හිසෙහි රතු උපුල් පළඳා ඇති තැනැත්තිය කෙරෙන් ජනයා බලාගෙන යන්නාහුය.'' යන ගීයෙහි සඳහන් උදය රජු ක්‍රි.ව.787 සිට792 අතර කාලය රජ කරන්නට ඇතැයි පැවසේ (දිසානායක, 1963, 345 පිටුව).

මේ ගීයෙන් පාඨකයාට සිය අඹුව සිහි කරවනු දක්නට ලැබෙන අතර ඇතැම් කතුන්ගේ අමනෝඥ ගති පැවතුම් නිසා ජනයා ඔවුන් හා සම්බන්ධයක් ඇති කර ගැනීමට අකමැත්තක් පළ කරන බව පෙනී යයි. ගෘහස්ථ ජීවිතයේ පවතින ඇතැම් ගැටලු විවරණය කිරීමට අවධානය යොමු කොට ඇති බව පෙනී යන අතර සමකාලීන ජීවිත තතු විවරණයට බඳුන් කෙරේ. වස්තු විෂය මනාව සැලසුම් කිරීම, ඉතා අරුත්සරු වූ හා උත්තේජනකාරී වචන හා වාක්‍යාංශ ද රමණීය ශබ්ද තෝරා ගැනීම යන කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කරන කල සීගිරි කවීන්ගේ අවධානය කොතෙක් ද යන්න ගම්‍ය වන බව විචාරකයන්ගේ මතය යි (ගම්ලත්, 2000, 272).

කෙනෙකු මරණාසන්න වූ විට ඊළඟ භවයට ඇති වන චුති චිත්තය හේතු කොට ගෙන ඔහු යහපත් ලෙස මිය යා යුතු බව අතීතයේ මෙන් ම වර්තමානයේ ද පිළිගැනුණකි. ''උතුරොළ'' පිරිවෙණ කර වූ ''රියන්දළ'' නැමති ලේඛකයා අතින් රචිත මේ ගීයෙන් ගම්‍ය වන්නේ ජීවිතය, මරණය, මරණාසන්න මොහොත, ඊළඟ ආත්මය යන කරුණු කෙරෙහි යම් අවබෝධයක් ඇතැම් සීගිරි කවියන්ට තිබූ බව යි.

''කිහි නොදෙම් දයින්දිලි මන

ඇ(ෙ)දත් එක්නට්

ජීව තබය් මන ම පිරිබුන්හ එය්

ම-(3)-තු කියන්නෙය් '' (463 ගීය) (මුදියන්සේ (1963),194) මේ ගීයෙහි ''උතුරොළ පිරිවෙන කරයු ලෙ ලියන්දළ්මි ලීමි'' යනුවෙන් ගීය ලියූ තැනැත්තාගේ නම සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ ලේඛකයා කවුරු ද පමණක් නො ව එවකට සිංහල මිනිසුන් අතර පවත්නා චාරිත්‍රයක් වන කෙනෙකු මරණාසන්න මොහොතේ ඔහුට යහතින් මිය යාම සඳහා මුව තුළට වතුර වත් කිරීම එකල ද පැවතුණු බව යි. ඒ අනුව මේ ගීයෙන් ජීවිතයේ අනිත්‍ය ස්වභාවය විවරණය වේ.

මෙබඳු සිරිත් විරිත් ඇසුරු කර ගෙන සිදත් සඟරා කතුතුමෝ ''උකටලියට දැලැඳිය දෙනු පිය සමාම්හි'' (කුමාරතුංග, 2478, 250) ප්‍රිය විප්පයෝග දුක්ඛයෙන් ම මැඬුණියට දිය දෝතක් දෙනු යන්නෙන් සඳහන් වේ. උක්ත සීගිරි කවියාට මෙන් ම සිදත් සඟරා කතුවරයාට ද කෙනෙකුගේ චිත්ත චෛතසිකයන් විවරණයට යම් අවබෝධයක් පැවති බව හැඟී යයි.

සීගිරි ගී රචනා කළ කවියන් අතර පැවිදි තෙරවරුන් ද සිටි බව 136, 224, 461 යන ගීවලින් පැවසේ. එහිදී ත්‍රිපිටකයේ යම් යම් කොටස් වනපොත් කර ගෙන සිටි භික්ෂූන්හට ඒ ග්‍රන්ථවල නම් පවා අමතර නාමයක් වශයෙන් යෙදූ බවත් සඳහන් වේ.

''සවසති

අ(බා මි)හිදුවහන්දුයෙන් ආ කුද්ගත්සිරි-''

(224 ගීය) (මුදියන්සේ (2004),82)

පැරණි කාලයේ දී ත්‍රිපිටකයේ ඇතැම් කොටස් වාචෝද්ගතව දරා ගෙන සිටි භික්ෂූන්හට ඒ ග්‍රන්ථවල නම් පවා අමතර නාමයක් හැටියට යොදා ගත් අතර නූතනයේ මෙන් පැවිදි වන විට ගිහි නාමය අතහැර වෙනත් නමක් යොදා ගැනීම මෙකල සිරිත වුවත් එකල

එසේ නොවුණි. මෙහි අර්ථය වන්නේ ''අබා මිහිඳු වහදු'' (විහාරයෙහි වූ) 'කුද්ගත් සිරිනා තෙරුන්ගේ ලේඛකයා (වන) සලමෙයි (නැමැත්තා) වෙමි (මෙය) ලීමි' යනු යි.

''කුදු ගත් සිරිනා තෙරුන්'' (224) ඇතැම් පැවිද්දන් විසින් ලියන ලද ගී කලාතුරකින් දැකිය හැකි වුව ද සරාගී හැඟීම් දනවන ගී පද රචනය පැවිදි බව කෙලසන තරම් වරදක් නො වන බව ද පැවසෙන අතර 'කුදුගත' යනු සූත්‍ර පිටකයේ ඛුද්දක නිකාය බවත් ''සිරිනා'' යනු පුද්ගල නාමයක් බවත් කිය වේ (දිසානායක, 1963, 265 පිටුව).

පැවිද්දන් අතින් රචිත ඇතැම් ගීවලින් ගිහිපැවිදි භේදයකින් තොරව සෞන්දර්යට දක්වන ඇල්ම කෙතරම් ද යන්න පැවසේ.

''(ප)ලාවතුවෙහෙරින් ආ නුගතෙරමි (ලී) මි

මහනෙල්වනුන් එහි සිත්වන් වූ''

(461 ගීය) (මුදියන්සේ (2004),398)

සිත් වූ පරිදි මහනෙල් වන් (තැනැත්තියක්) එහි සිටිනු බලන්න යැයි පවසන්නේ පලාවතු වෙහෙරින් පැමිණි නුග (නැමති) තෙර හෙවත් ස්ථවිර තමා බවත් මේ ගීය තමන් විසින් ලියූ බවත් සඳහන් කරමින් ය. සෞන්දර්යය කෙරෙහි රුචිකත්වයක් දැක්වූ පැවිදි තෙම මහනෙල්මල් වැනි තැනැත්තියන් රතු මල් අතින් ගෙන සිටි බව සඳහන් කිරීමෙන් ගිහි පැවිදි කවරෙකු වුව ද සෞන්දර්යයට රුචිකත්වයක් දැක්වීම ස්වාභාවික ය.

අට වන ශතවර්ෂයේ අග භාගයේ හෝ නව වන ශතවර්ෂයේ මුල් භාගයෙහි ''දුවඟ ගී'' විරිතෙන් රචිත ගීයක් වන,

''ස්වස්ති කිව්සි තිස්පැවිජමි

සියි වෙජ්මැකෙය් දයෙන්දිලි''

(574 ගීය) (එම 276) යන්නෙන් පැවසෙන්නේ

ජලයෙහි අඳින ලද රේඛාවක් ඒ මොහොතෙහි ම මැකී යන්නා සේ ප්‍රියයා විසින් එය දන්නා ලද්දේ වුව ද ගුණ සාගරයක් බඳු තොපගේ අල්ප වූ වරදකින් ඔහු කෙලෙසින් කිපෙන්නේ වේ ද? සීගිරි කවියාට ප්‍රායෝගික ජීවිතය පිළිබඳ තිබූ අවබෝධය මෙයින් විද්‍යමාන වේ. සමාජයෙහි ජීවත් වන විවිධ පුද්ගලයන්ගේ චර්යාමය ගති/ලක්ෂණ විවරණයට ලක් වී තිබීම තවත් විශේෂත්වයකි. අලගියවන්නයන්ගේ සුභාෂිතයෙහි ද

''විමති දනන් හට කළ කිසි ගුණ නොම ඳ

එනැති වේය දිය පිට ඇඳි ඉරක් ලෙ ද'' (විමලකිත්ති හිමි (1978)) යනුවෙන් පසු කාලීන කාව්‍ය නිර්මාණවල ද පුද්ගල විග්‍රහයන්හිදී මෙ වැනි ම අදහස් හා බැඳුණු කාව්‍ය නිර්මාණවලට පූර්ව කාලීන ගී නිර්මාණ මූලාශ්‍රය වන්නට ඇතැයි සිතිය හැකි ය.

සීගිරි ගීවල අඩංගු කරුණු අතර රැකියා කළ ස්ථාන හෙවත් ශිල්ප ශාස්ත්‍ර උගත් ආයතනවල නම් පවා ඇතුළත් කරමින් තමා දරන්නේ කෙබඳු වෘත්තියක් දැයි පැවසීමට තරම් ඇතැම් සීගිරි කවීහු අවධානය යෙදවූහ.

''ශ්‍රී රුහුණ්මහගැමැ අනුරුමහපායින්

ආ පහණද(ස) වැසි සමනල් බතිමි ලීමි

බැලූබැලූයුන් ක(එ)වන් සිසි මුහැණ්හි'' (170 ගීය) (මුදියන්සේ (2004),236) ගීයට අනුව කවියා පැමිණ සිටියේ තරල්පා පිරිවෙන් ආයතනයකැයි සඳහන් වේ. එයින් අනාවරණය වන්නේ සමකාලීනව පිරිවෙන් අධ්‍යාපනය පැවතුණු බවත් රුහුණේ ''මහගම පහණදස'' නම් ස්ථානයෙහි වැසියෙකු වූ ''සමනල් බත'' නැමත්තා අතින් රචනා වූ ගීයක් බව යි.

දැනට රාම කැළේ, මන්නාරම, පොළොන්නරුව, කිබිස්ස ආදී ස්ථාන සීගිරි ගී ලියවෙන වකවානුව වන විටත් ජනප්‍රිය ප්‍රදේශ බව කුරුටු ගීවල අන්තර්ගත කරුණුවලින් අනාවරණය වේ.

මන්නාරම - මහපටන්ජූව (627 ගීය) (එම,493)

පොළොන්නරුව - පොලොන්නරු (233) (එම,271)

කිබිස්ස - කිවිසි (562 ගීය) (එම)

යන ප්‍රදේශ නම්වලින් තවදුරටත් තහවුරු වන්නේ සීගිරිය දැක බලා ගැනීමට පැමිණි පිරිස ලංකාවේ නොයෙකුත් ස්ථානවලින් පැමිණි බවත් සමකාලීන අනුරාධපුර යුගයේ සීගිරි අවට භූමි භාගය ස්වාභාවික සෞන්දර්යයෙන් පිරී ගිය අයුරුත් ය.

පැරණි ඉන්දියාවේ බලපෑමෙන් නොයෙකුත් උත්සව, ක්‍රීඩා පැවැත්වූ අතර එහිදී නැටුම්, ගැයුම්, වැයුම් ආදිය පමණක් නො ව විවිධ සම්භාෂණ පවත්වමින් ජනයාට විනෝදාස්වාදය ලබා දුන් බව ද ඇතැම් ගී නිර්මාණවලින් පැවසේ.

''(අ) (වු) (ද්) මුළු වෙ ගිරිහි යන වි අප මුළු විසිරි

(සි) හිදුන් සෙය හැගැ අප සිහි වන්නට් සිහිගිරි
(174 ගීය) (එම,239)

මේ ගීයට අනුව ජනයා මෙහි අවුත් පව්වෙහි රොක් වූ බවත් සීගිරි රජතුමාට මේ බව හැඟී ගොස් ඒකරාශි වූ අයට විසිර යන ලෙසත් දක්වමින් සීගිරිය අපට සිහි වූ බව පැවසේ. ඒ අනුව සීගිරියේ අනර්ඝ සිත්තම්වලට අමතරව නැරඹීමට හා විනෝද වීමට තවත් බොහෝ දේ තිබූ අතර ඒ සඳහා ලංකාවේ නොයෙකුත් ප්‍රදේශවලින් ජනතාව එක් රොක් වූ බව ද පැවසේ.

සීගිරි දර්ශනය දැකුම්කලු ස්ථානයකි. අවට පරිසරය ප්‍රේමයේ ආස්වාදය දිනා ගත හැකි පෙම් සුව විඳීමට සුදුසු ස්ථානයක් ද වේ. සීගිරි චිත්‍ර දැක බලා ගත් ඇතැම් කවියන්, පෙම්වතුන් එකමුතු කිරීමට තරම් නිර්මාණකරණයට පෙලඹුණු බව අනාවරණය කළ හැකි ය.

''නො (ස)දහන් වැ (යෙ මෙ)ය

දුවය උඩගල ය(න) මෙන් ත(බ)යි'' (54 ගීය)

''(ස්වස්ති)

යෙනු(යුන්) නියත් ගියෙ පුන

සිහි වෙමින් සිහිගිරි (55 ගීය) (එම 180-181)

සීගිරි චිත්‍ර දැකබලා ගත් ඇතැම් අය එම චිත්‍රයන්හි නිරූපිත ස්ත්‍රීන්ට ආමන්ත්‍රණය කෙළේ ජීවමාන ස්ත්‍රීන් යැයි හැඟීමක් ඇති වූ නිසා ය. එයින් විද්‍යමාන වන්නේ සීගිරි චිත්‍රවල පවතින ජීවමාන ගුණය යි. බොහෝ කාන්තා චිත්‍ර ගොඩනගා තිබෙන්නේ ඒ ඒ ඉරියව්වලට අනුකූලව කාන්තාවන්ගේ හැසිරීම්, ඇස්වල ස්වරූපය, ශරීර ස්වභාවය හා අනෙකුත් අංගෝපාංගවල විපර්යාසයන් සැලකිල්ලට ගනිමින් ය.

''විදුලියට සමාන කළ හැකි ගැහැනුන් දැකීම - 192 ගීය'' (එම,248)

''ගැහැනුන් ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කිරීම - 161 ගීය'' (එම,232)

''රන්වන් කාන්තාවන් දැකීම නිසා තම හැඟීම් පවා වෙනස් වී යාම'' (එම,233)

''මිනිසුන්ගේ හදවත් පවා පැහැර ගැනීමට ශක්තිමත් සිනිඳු අඟ පසඟ ඔවුන් සතු වීම - (401 ගීය) (එම)

''අතිසැප විඳීමට තරම් ඔවුහු පෙලඹ වීම. - 460 ගීය''(එම)

''ජරාව, ව්‍යාධිය, මරණය ආදියට ගොදුරු නො වන යොවුන් වයසේ සිටින කාන්තාවන් වීම'' (එම,448) ආදී තොරතුරුවලින් පැවසෙන්නේ නිර්මාණ කරණයට සීගිරි කවියා දැක්වූ සාමර්ථ්‍යය යි. ජීවිතයේ සෑම පැතිකඩක් ම විවරණය කිරීමට ඔවුහු උත්සාහ දැරූහ. සමකාලීන රාජකීය කාන්තාවන් ගත කළ සුඛෝපභෝගී ජීවිත ප්‍රවෘත්තිය ද අනාවරණය කිරීමට සීගිරි කවියා පොහොසත් වී තිබිණි. සාම්ප්‍රදායික වර්ණනාවට බර වෙමින් අතිශෝක්තියට යොමු වූ ඇතැම් ගී නිර්මාණ තුළින් සීගිරි ළඳුන්ගේ අඟ පසඟ, ඉඟි බිඟි, විවිධ චර්යා අර්ථාලංකාරවලින් වර්ණිත ය.

''මුතු මෙන් දිලිසෙන දත් පෙළ''

''පබළු පැහැය ගත් දෙතොලි''

''හංසයන් වැනි පියයුරු''

''නිල් දළු නැමති ඇස් බැම'' (90 ගීය) (එම 196)

''රතු පැහැ ගත් අත්ල''

''තඹ පැහැති දෙතොල්'' (එම,480)

මෙබඳු උපමා පසුකාලීන ගද්‍ය, පද්‍ය කවියන් ද භාවිතයට ගන්නට ඇත්තේ සීගිරි ගී ආභාසයෙහි බොහෝ විට මනඃකල්පිත උපමාලංකාරවලට වඩා තමන් ජීවත් වන අවට පරිසරයෙන් වස්තූපමා තෝරා ගැනීමේ රුචිකත්වය හේතුවෙනි. සීගිරි කාව්‍ය නිමැවුම් අතර ළඳුන්ගේ හැඟීම් නිරූපණය, ඒ හා බැඳුණු ශාරීරික විපර්යාස විවරණයට බඳුන් කර තිබෙන්නේ පුද්ගල චර්යාවන් පිළිබඳ අනාවරණයක යෙදෙමින් ය.

''බැලුම් නැමති හීයෙන් කවියෙකුගේ හදවත පළාගෙන යන සේ විදලීමට කාන්තාවක් සමත් වීම.'' (364 ගීය) (එම,346)

''ගැහැනියකගේ මුහුණ සරොස් වූ විට කාගේ සිත්හි වුවද බියක් ඇති වීම.(598)'' (එම,477)

''ගැහැනුන්ගේ වහලුන් බවට පත් වූ අය නඟන විලාප. (633)''(එම,497)

''කාන්තාවන්ගේ සහජ ගති ලක්ෂණ. (603 ගීය)''(එම,480)

කාන්තාවන් සරොස් වූ විට ශාරීරිකව ඇති වන විපර්යාස, සොම්නසින් සිටි කල චිත්‍ර ප්‍රබෝධය නිසා ඇති වන මුහුණේ ඉරියව් චෛතසිකයන් විමර්ශනයට බඳුන් කිරීමට ද මේ කවීහු පොහොසත් වූහ. කව්සිළුමිණ කාව්‍යයේ දී තම සැමියා කුස කුමරු යැයි හඳුනාගත් පබවත ලැජ්ජාවෙන් හා කේන්තියෙන් හැසිරුණු අයුරු දක්වන්නේ

''මේ යක් ලූ මාහිමි පබවත්ලු ඔහු විදිනි.

නිසයුරු අඳුර කෝ සමඟ ගොවළුයේ කෝ, හස් ඉස්බුම්'' (ආරියපාල, 1994, 31 පිටුව). මගේ හිමියා මේ යක්ෂයාලු, ඔහු ලබන තැනැත්තිය මේ පබවත්ලු. සඳ, අඳුර හා එක්වීමක් කොයින් ද හරක් කුරයෙන් සැදුණු වළෙහි හංසයන්ගේ ලැගීමක් කොයින් ද, කුසගේ විරූපි බව හේතු කොට ගෙන බොහෝ කලක් ඔහු විසින් ඇයව රැවටීම නිසා පබවතට ඇති වූ කෝපය පිට කරනු ලැබුවේ කුසට අවමාන කිරීමෙනි, බැණ වැදීමෙනි. ඔහුව අපහාසයට හා උපහාසයට ලක් කරමිනි. සීගිරි කවියා ද කාන්තාවන්ගේ මේ ගති ලක්ෂණ සාර්ථකව විවරණයට බඳුන් කරන්නේ පුද්ගල ස්වභාවය මැනවින් තේරුම් ගෙන නිර්මාණාත්මක ගී පබැඳුම් ඇසුරිණි.

තාරුණ්‍යයේ දී කෙනෙකු දැකීමෙන් සිතෙහි හැඟීමක් ඇති වීම ප්‍රේමයේ බීජ අවස්ථාව වේ. සීගිරි කුරුටු ගී අධ්‍යයනයේ දී තරුණ තරුණියන්ගේ හැසිරීම් රටා සනිටුහන් කරන්නේ ජීවිත පරිඥානයක් තිබූ කවියෙකු හැටියට ය.

''ස්වස්ති වජිරාගී

තනපට් වෙළ සරග්මල් සිහිලස් කොට් ලූ''

''දැකැ මන ම නියැළැ බෙයන්දහි රන්වතක් දග්නෙත්''

(327 ගීය)(එම, 324-325)

''වජිර'' නැමැත්තා අතින් රචිත මේ ගීයෙහි දැක්වෙන්නේ සිහිල සඳහා සුවඳැල් මල් තන පටෙහි වෙළාගත් රන්වන් දිගැසියක බෙයදෙහි දැක මගේ සිත දොම්නස් වූ බව යි. සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ ශ්‍රී හර්ෂ දේව රජුගේ රත්නාවලී කෘතියෙහි උදේනි රජු දැකීමෙන් සාගරිකාගේ සිතෙහි ඇති වූ හැඟීම ප්‍රේමයේ බීජ අවස්ථාවට කදිම නිදසුනකි.

''අනංග දේවයාණෙනි, ඔබ වහන්සේට නමස්කාර වේවා. බැලිය යුතු දේ නම් සේරම බැලුවා. කවුරුවත් මා දකින්නට පෙර මෙතනින් යන්න ඕනෑ'' (නිශ්ශංක, 2016, 22 පිටුව).

මෙහිදී ශ්‍රී හර්ෂ සාගරිකාගේ මුවගට නංවා ඇති වදන් පෙළින් ඇගේ හැසිරීම් රටාව විවරණය කොට තිබෙන්නේ ප්‍රේමයට ගොදුරු වූ පෙම්වතියගේ ස්වරූපය, ගති ලක්ෂණ, චර්යා පද්ධතිය පිළිබඳ සාර්ථක විවරණයක් කරමින් ය. පාඨක ප්‍රේක්ෂක දෙපක්ෂයට ම එයින් ජීවිතාවබෝධයක් ලැබෙනු නිසැක ය.

සීගිරි කවීන්ගේ නිර්මාණ අතර ප්‍රේම වියෝගය හෙවත් විප්‍රලම්බ ශෘංගාරය නිරූපණය කෙරෙන නිර්මාණ බෙහෙවින් දක්නට ලැබීම විශේෂත්වයකි. ''නිරිඳා සැබවින් ම මළ හෙයින් (ඉන් ඇති වූ) ශෝකයෙන් ළය නො වැවෙන හෙයින් බෙයදෙහි රන්වන් (ලියන්) ගිරිහිසින් පතිත අයුරුයි'' (මුදියන්සේ (2004)198). ප්‍රේම වියෝගය කොතරම් බලවත් ද කිවහොත් පර්වත මුදුනින් පතින්නට තරම් බරපතළ තත්වයට පත් ව තිබිණි.

''(සව)සති

නරනින්ද් ලයු මෙළෙයින් සෙවින් ළ'' (300 ගීය) (එම,309)

දම්සක් පැවතුම් සුතුරෙහි දුක ඇති වීමේ හේතුව හැටියට ''පියෙහි විප්පයොගො දුක්ඛො'' (ඤානානන්ද හිමි (2547)57) ප්‍රියයන්ගෙන් වෙන් වීමේ දුක සීගිරි කවියහු අතර සීගිරි ළඳුන් දැක ඔවුන්ගෙන් වෙන් ව යාම මානසික වේදනාවක් හැටියට දකිමින් කළ නිර්මාණය මීට කදිම නිදසුනකි. මෙහිදී ප්‍රියයාගෙන් වෙන් වූ ස්ත්‍රියකගේ ස්වභාවය කවියා විස්තර කොට තිබෙන්නේ,

''හදවතෙහි දැල්වෙන ශෝකය වැහැරී ගිය මුහුණක් පළ කරන කාන්තා තොමෝ නෙතින් කඳුළු දාරා පතිත කරවා පර්වත පාර්ශවය අතහැර ගියා ය. ''

''පරත්තැ සෙන් ගී

ගමනැ කැළැකිර්ලි

තුනුවන් ළසොව් තැව්ලි'' (340 ගීය) (මුදියන්සේ (2004)331)

මොවුන්ගේ ශෝකය මායාවක් බව පවසන මේ ගීයෙන් පැහැදිලි වන්නේ ජීවිතයේ අනිත්‍ය තත්වය පිළිබඳ අවබෝධය යි. හැඟීම් කොතරම් විවිධ වුවද එය රසවත් භාෂාවකින් සීමා සහිත ඉඩ ප්‍රමාණයකින් ලියා දැක්වීමට මේ කවියන්ට සිදු විය. එමෙන් ම ඔවුන්ගේ සිත් තුළ සියුම් සිතුවිලි ද පහළ වූ බව ඇතැමුන්ගේ පිළිගැනීම යි (කුලසූරිය 1962 238).

සීගිරි ගී නිර්මාණ අතර පූර්ණ කාලීන සමාජයේ පැවතුණු විවාහ ක්‍රමයක් පිළිබඳ ව සඳහන් වීමෙන් ඇතැම් කවියන්ට තිබූ සමාජාවබෝධය විද්‍යමාන වේ. ගාන්ධර්ව විවාහ ක්‍රමය බුද්ධ කාලීන භාරතයේ පැවතුණකි.

''කරයි ලබු පෙ(රෙ)ට් පියහට් ගැන්දැව් සන්ද්හය ..... (393)''
(එම, 362)

පිපුණු මල් සහිත කිණිත්තක් පෙරටු කර ගෙන සිටි කාන්තාව ගන්දර්ව විවාහයෙන් සිටි බව පැවසේ. සමකාලීන වශයෙන් ඉන්දියාවේ පැවති මෙවැනි විවාහ ක්‍රම මෙරට ද පවතින්නට ඇතැයි මේ ගී නිර්මාණය තුළින් සැක පහළ කර ගත හැකි වන අතර තත් කවීන්ගේ නිර්මාණවල විවිධත්වය ද සමගින් ප්‍රකට වේ. අට වන ශතවර්ෂය අවසාන භාගයෙහි යා ගී විරිතෙන් රචනා කරන ලද පහත දැක්වෙන ගීය තුළින් එවකට චීන රෙදි වර්ග මෙරට ඉහළ පෙළේ කාන්තාවන් ඇඳ පැළඳි බව පැවසේ. ඔවුහු අතිසුඛෝපභෝගී ජීවිත ගෙවමින් කාලය ගත කළහ. එබඳු නාගරික කාන්තාවෝ වනාශ්‍රිත ප්‍රදේශ රුචි නො කළහ.

''වහවත වහවමහ (මෙ)සෙයනි

අ(ප) සිති වියි(න)''

(නො) රෙන්දෙ වෙනෙ සිමාපට බෙජී.....

(399 ගීය) (එම, 366)

වැහැවිය යුතු නම් මෙසෙයින් අප සිතු පරිද්දෙන් වැහැවෙමු. චීන රෙදිවලින් තැනූ ඇඳුමක් හැඳගත් ඒ රන්වන් තැනැත්තිය සැඟවී

සිටීම සඳහා මේ වනයෙහි රඳන්නේ නැතැයි පැවසේ. ඒ අනුව සමකාලීන සමාජයේ පන්ති විෂමතාව මෙමඟින් අනාවරණය වේ.

වැලිගම වැසියෙකු වූ අග්බොහි නැමැත්තා රචනා කරන ලද පහත දැක්වෙන ගීය සමකාලීන ලංකාවේ ඇතැම් ප්‍රදේශවල කුලභේදය ක්‍රියාත්මක වූ බව සැල කෙරෙන්නකි.

''පිළ අපුලන තොට් නැත්තෙන්

හළුගර් නැත්තෙන්

වැ(දැ) වෙසෙස් රිදියක් බෙයන්ද්හි

රන්වනුන් අතුරේ'' (410 ගීය) (එම, 372)

රෙදි ඇපිල්ලීම සඳහා තොටු පොළක් ද ඒ රෙදි වනා තැබීම සඳහා ගෙයක් ද නොමැති හෙයින් රජක කාන්තාවක ගල මුදුනෙහි සිටින රන්වන් කාන්තාවන් අතරට වැදී සිටින බව කියවෙන මේ ගීයෙහි ඇතුළත් වන්නේ එකල ඇතමුන් ගත කළ දුෂ්කර ජන ජීවිතය යි. සාහිත්‍ය නිර්මාණයක් වශයෙන් සීගිරි ගී අධ්‍යයනයේ දී මෙබඳු ගී තුළින් සමකාලීන කාන්තාවන්ගේ ජීවිතය ද විවරණය වේ. ලංකා සමාජයේ මැත භාගය දක්වා ඇතැම් ප්‍රදේශවල රදා කුලයේ අය ජීවත් වූ අතර ඔවුන්ගේ ප්‍රධාන රැකියාව වූයේ අන්‍යයන්ගේ රෙදි පිරිසිදු කිරීමේ වෘත්තිය යි. ඒ අනුව සීගිරි නිර්මාණ අතර රෙදි ඇපිල්ලීම, රෙදි වියළීම ආදී කාර්යයන්වල නියුතු වූවන්ගේ වෘත්තීයයන් පිළිබඳව ද තත් කවීන්ගේ අවධානයට යොමු වීය. වැඩවසම් රාජ්‍ය තන්ත්‍රය තුළ ඔවුන් ගත කරන සුඛෝපභෝගී ජීවිතය විවරණය කිරීම අනෙක් අතින් සාමාන්‍ය ජනයාට සමාජයේ අත් වූ ඉරණම අනාවරණය කිරීම ඇතැම් සීගිරි කවියන් අවස්ථාවක් කරගෙන තිබේ.

''ඒ රජහු අගීතක් (බැලීමො) ආ අප (ඇ) ස්ති

බලමින් හෙර් සෙයින් බණ(න්ති) අත් (නෙත්) දා හස් ''(417 ගීය) (එම, 375)

සීගිරියට පැමිණි අපි රජතුමාගේ අන්තඃපුර කාන්තාවන් ඇසින් දුටුවත් සෙරක ආකාරයෙන් බලමින් අතින් සංඥා කරමින් සිටි බව පැවසේ. අන්තඃපුර කාන්තාවන් හුදකලාව වාසය කරන බව මෙයින් පැවසෙන අතර සාමාන්‍ය ජනයාට ඔවුන් දැක බලා ගැනීමට අවස්ථාවක් නැතැයි සඳහන් කොට තිබීමෙන් පෙනී යන්නේ කාන්තා සමාජය අතර පැවතුණු විෂමතාව කොතරම් ද යන්නයි.

පෙර කරන ලද කුසලාකුසල විපාක හේතු කොට ගෙන ඊළඟ ආත්ම භාවය සුඛිත හෝ මුදිත වන බව සීගිරි කවීන්ගේ නිර්මාණ තුළින් ගම්‍ය වේ.

''පෙර කල්හි පින් නොකොට සිටියනනහ (ට නො) මෙ වූ

අගුරෙ එබූ රන් ගිනියම් නො දකි (වි) ද කා නො මුයුන්

(241 ගීය) (එම, 275)

පූර්ව ආත්මභාවවල පින් නො කොට සිටිය වුන් මේ ආත්ම භාවයේ දී ගත කරන ජීවිතය කෙබඳු ද යන්න පෙන්වා දී තිබෙන්නේ ජීවිත යථාර්ථය පිළිබඳ අවබෝධය ප්‍රකට කරමින් පමණක් නො ව පුනරුත්පත්තිය පිළිබඳ සංකල්පය පිළිගනිමින් ය. සීගිරිය නැරඹීමට පැමිණි අය අතර තරුණයෝ ද සිටියහ. එක්තරා තරුණයෙක් රූමත් යුවතියක දෙස බලා තමා ලවා කතා කරවන්නට උත්සාහ ගත්ත ද ඇ නො බැණ සිටී. ඒ හේතුවෙන් සිත් තැවුලට පත් තරුණයා පවසන්නේ

''සපු (මල) නිළිබඳල ගත හෙළිල්ලඹුයකු මන

මයි දී නෙත තමා මෙ බල (ඇ) තම බණවත නොබෙණයි ''(21 ගීය) (එම,164)

සපු මලක් හා නෙළුම් පොහොට්ටුවක් අතින් ගත් ළා පැහැති යුවතියක් තම සිත හා නෙත මට දී තොමෝ මා දෙස බලයි. මා ලවා කතා කැරැවුව ද නො දොඩයි. තමා සිත් ගත් කෙනෙකු දැකීමෙන් ඇති වන හැඟීම ප්‍රේමයේ බීජාවස්ථාවයි. එම ප්‍රේම බීජය ක්‍රමයෙන් වැඩෙන්නේ පෙම්වතිය සමඟ අල්ලාප සල්ලාපයේ යෙදීමෙනි.

මෙයින් ළඳුන් කෙරෙහි ඇති වූ ප්‍රේම සංකල්ප කෙතරම් ද යන්න මේ ගීය රචනා කළ තැනැත්තාගේ සිතුවිලිවලින් ප්‍රත්‍යක්ෂ වේ.

> ''කපුගම පිරිවෙන කර (යූ උ) පති (ස්) හිමියන්ගේ මානාමි ලියමි'' (275 ගීය)(එම, 295)
>
> කපුගම පිරිවෙන කර වු උපතිස් හිමියන්ගේ (වංශයෙහි වූ) මාතා (නැමැත්තා) වෙමි. මෙය ලීවෙමි.
>
> ''බොයිගමුවැසි ම කිවි මිහිදලැ ගී'' (473 ගීය) (එම, 407)
>
> බොයිගමු (නම් ස්ථානයෙහි) වැසියෙකු වූ මිහිදල කවියා (නැමති) මා (ගැයූ) ගීයයි.
>
> ''නලගොම්බු මිතල්බතී ලී (ගී)'' (489 ගීය) (එම, 416)
>
> නලගොම්බු නම් ස්ථානයෙන් පැමිණි මිතල්බතී ලියූ ගීයයි.

මෙසේ කරුණු විමසා බලන විට සීගිරි ගී රචනා කරන ලද බොහෝ කවියන් අතර නම් ගොත් හා ග්‍රාමනාම සඳහන් කිරීම, නිර්ණාමික ගී දක්නට ලැබීම, විවිධ වෘත්තීන් අළලා ගී රචනා කොට තිබීම, රජවරුන්, පැවිද්දන්, කාන්තාවන් විවිධ නිලධාරීන් හා නොයෙකුත් රැකියාවල නියුතු වූවන් ද ආදී වශයෙන් සමාජයේ විවිධ පුද්ගලයන් අතින් සීගිරි ගී රචනා වී තිබීම දක්නට ලැබේ. සීගිරි ගීවල අන්තර්ගත කරුණු විමර්ශනයේ දී කාන්තා ගති ලක්ෂණ, ප්‍රේමයේ ස්වභාවය, පෙම්වතියන්ගේ හැසිරීම් රටා සමකාලීන ඇතැමුන්ගේ ජීවිත ප්‍රවෘත්ති, විවිධ රටවල සමඟ ඇති කරගත් සබඳතා, දාර්ශනික කියමන් පුද්ගලයන්ගේ චරිත ස්වභාවය, චිත්ත චෛතසික හේතුවෙන් ඇති වන ශාරීරික විපර්යා ආදී වශයෙන් විවිධ පැතිකඩ ඔස්සේ කවීන්ගේ නිර්මාණ විසිරී පැතිරී ඇති බව ගම්‍ය වේ.

**නිගමනය**

ලංකාවේ ඉපැරණි ම සාහිත්‍ය සටහන වන සීගිරි ගී විවිධ ලේඛකයන් අතින් ස්වකීය අත්දැකීම් ඇසුරෙන් රචනා කරන ලද කාව්‍ය විශේෂයකි. අරුත් නො යෙදෙන හැඟීම් පහළ නො කෙරෙන

සිගිරි ගී කැටපත් පවුරෙහි දක්නට නොමැත. වදන් තෝරා ගැනීම ඒවා අරපිරිමැස්මෙන් යෙදීම ශබ්දාර්ථ සහිත වීම නිසා රසාලිප්ත ගුණයෙන් යුක්ත ය. සීගිරි ගී රචකයන් ප්‍රාදේශීය වශයෙන් ඔවුන්ගේ විවිධත්වය පෙන්නුම් කිරීම, වෙනස් වෙනස් චින්තනයන්ගෙන් යුක්තවීම, අධ්‍යාත්මික හැඟීම් නිරූපණය ස්වාධීන කාව්‍ය නිර්මාණ කිරීමට ඔවුන්ට පැවතුණු ඉඩකඩ ආදී වශයෙන් හුදෙක් ප්‍රේමය පිළිබඳ ව හා වෙනත් මනෝභාවයන් පිළිබඳ ව මේ අධ්‍යයනයේ දී අවධානයට ලක් කෙරිණි. සාහිත්‍ය සටහනක් ලෙස ඇගයීමේ දී පුද්ගල මනස තුළ ක්‍රියාත්මක වන හැඟීම් ප්‍රකාශනය, කාලීන සමාජ තොරතුරු විවරණය, පුද්ගල හා සමාජ යථාර්ථය හෙළි කිරීම, දාර්ශනික කියමන් ඇතුළත් කරමින් ලෝක ස්වභාවය හඳුනා ගැනීම, පුද්ගල ක්‍රියාකාරීත්වය තුළින් ඇති වන චර්යාවන් අවස්ථාවට අනුකූලව වෙනස් වන අයුරු ඉදිරිපත් කිරීම ආදී කරුණු හේතුවෙන් සීගිරි ගී නිර්මාණයට අනුභූති වූ විවිධත්වය කෙබඳු දැයි යන්න නිගමනය කළ හැකි ය.

## ආශ්‍රේය ග්‍රන්ථ

ආරියපාල, ඇම්. බී. (1994). කව්සිළුමිණ හෙවත් කුසදාවත, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියපාල, ඇම්.බී. (1994). කව්සිළුමිණ, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුලසූරිය, ආනන්ද (1962). සිංහල සාහිත්‍ය I, මහරගම: සමන් මුද්‍රණාලය.

ගම්ලත්, සුචරිත (2000). සීගිරි කුරුටු ගී, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, ප්‍රශාන්ත (2019). සීගිරි දොරටු, ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, ප්‍රශාන්ත, (1998). සීගිරිය ආරම්භක පුරා විද්‍යාව, අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත.

දිසානායක, මුදියන්සේ (1969). සිංහල සාහිත්‍ය ලතා, කොත්මලේ අමරවංශ හිමි (සංස්) අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශනය.

දිසානායක, සෙනරත් (2011). සීගිරිය, කුරුණෑගල: අනුර ප්‍රින්ටර්ස්.

නාරද හිමි, කිවුලේ ගෙදර (2006). සීගිරි ගීවල වස්තු විෂය හා අත්දැකීම් ද නිර්මාණ රීතිය ද නිදහස් දේශීය කවිත්වයක් පිළිබිඹු කරයි. (ලිපිය) විමල ප්‍රභාසා, නුගේගොඩ: ශ්‍රී දේව මුද්‍රණාලය.

නිශ්ශංක, පියදාස (2016). රත්නාවලී, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

පරණවිතාන, සෙනරත් (2001). පුරාවිද්‍යා පර්යේෂණ, බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

මීගස්කුඹුර පී. බී., (2004). සීගිරි ගී කාව්‍ය භාෂාව මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න උපහාර ලිපි සංග්‍රහය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මුදියන්සේ, නන්දසේන (2004), සීගිරි පද්‍යාවලිය, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදයෝ.

මුදියන්සේ, නන්දසේන (1963). සීගිරි ගී (ද්විතීය භාගය), කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

මුනිදාස, කුමාරතුංග (1947). සිදත් සඟරා විවරණය, කේ.ඒ. ආරිදාස මුද්‍රණාලය.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ (1951). ශිලා ලේඛන සංග්‍රහය, මොරටුව.

වික්‍රමසිංහ, මාර්ටින් (1945). සිංහල සාහිත්‍යයේ නැඟීම, නාවල: සරස ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, මාටින් (1941). විචාර ලිපි, ගල්කිස්ස.

සන්නස්ගල, පුංචි බණ්ඩාර (1947). සිංහල සාහිත්‍ය වංශය, කොළඹ: දිනමිණ යන්ත්‍රාලය.

Paranavithana, S. (1956). Sigiri Graffiti Vol. II, Text and Translation with notes and Glossary, O.U.P.

Paranavithana, S (1939). Sigiri Graffiti Earliest Extant Specimens of Sinhalese Verse, JRAS.CB Vol. xxxiv.